## ඉතිහාසය ඉතිහාසඥයන්ට පමණක් පැවරීම

සිංහලයන් පිටරටකින් මෙරටට පැමිණි ජාතියක් නොව මෙරට ම නිර්මානය වූ ජාතියක් බව අප කියන්නේ කෙසේ ද? මහාවංශයට අනුව සිංහලයන් මෙරටට පැමිණියේ ඉන්දියාවෙන් නොවේ දැයි කිසිවකු ඇසීමට ඉඩ ඇත. එමෙන් ම අනෙක් අතට තවම සිංහල යනුවෙන් ජතියක් බිහි වී නැතැයි කියන කසිකබල් මාක්ස්වාදියෝ ද වෙති. ඇතැම් අනුකාරක ඉතිහාසඥයකු යැයි කියාගන්නා අයකුට අනුව සිංහල ජාතිය මෙරට නිර්මානය වූ ජාතියක් බව සැබෑ නමුත් ඒ බිහි වී ඇත්තේ එකොළොස්වැනි සියවසෙන් ද පසුව ය. මේ කොයි කවුරුන් වුව ද තම මතය ප්‍රකාශ කරන්නේ යම් දෘෂ්ටි කෝනයක සිට ය. කසිකබල් මාක්ස්වාදියාට ජාතිය යන්න පිළිබඳ නිර්වචනයක් සහ ප්‍රවාදයක්, එනම් මතවාදයක් වෙයි. ඒ මතවාදයට අනුව ධනපති ක්‍රමය බිහිවීමට පෙර, එය යම් වර්ධනීය තත්ත්වයකට එළඹීමට පෙර ජාතියක් ඇතිවිය නො හැකිය. ලංකාවේ තවමත් ධනපති ක්‍රමය ජාතියක් ඇතිවීමට තරම් වර්ධනය වී නැත. එබැවින් ලංකාවේ තවමත් සිංහල ජාතියක් ඇතිවීමට ඉඩක් නැත. සිංහල ජාතියක් කවදා හෝ ඇතිවීමට නම් එයට පෙර ධනපති ක්‍රමය යම් තත්ත්වයකට වර්ධනය විය යුතුව ඇතැයි කසිකබල් මාක්ස්වාදියා පවසනු ඇත.

ඒ මතය ධනපති ක්‍රමය ඇතිවීම, ජාතිය හා ජාතිය ඇතිවීම පිළිබඳ ව වූ මාක්ස්වාදී මතවාදය සමග සංගතවනවා ඇත. එහෙත් ප්‍රශ්නය කසිකබල් මාක්ස්වාදී මතවාද නිරීක්ෂණ සමග නොව අභ්‍යන්තරව වුව ද කෙතෙක් දුරට සංගත ද යන්න ය. ලෝකයේ ජාතීන් ඇතිවූයේ එංගලන්තයේ ඉංගිරිසි ජාතිය ඇතිවීමත් සමග යැයි පවසන මේ මතවාදය ජාතීන් ඇති වී නැතැයි ඔවුන් ම කියන අවස්ථාවල දී ද ජාතියක ස්වයංනිර්ණ අයිතිය ගැන කතාකරයි. නෝර්වේ හි ස්වයංනිර්ණ අයිතිය ගැන මාක්ස්වාදයේ කතාකෙරුණේ එහි ජාතියක් නැතැයි මාක්ස්වාදය ම කියන අවස්ථාවල ය. කසිකබල් මාක්ස්වාදය අඩුම තරමින් අභ්‍යන්තරව හෝ සංගත නො වෙයි. ලංකාවේ සිංහල ජාතියක් ඇතිවීමට තරම් ධනපති ක්‍රමය වර්ධනය වී නොතිබුණ ද දෙමළ ජාතියේ ස්වයංනිර්ණ අයිතිය ගැන කතාකිරීම කසිකබළුන්ට ප්‍රශ්නයක් නො වෙයි. ජාතියක් ඇතිවීමට ධනපති ක්‍රමය වර්ධනය වී තිබිය යුතු ය යන්න ඉවත්කිරීමට කසිකබල් මාක්ස්වාදීන්ට සිත් නොදෙන්නේ බටහිර දැනුම සම්බන්ධයෙන් ඔවුන් දක්වන දීන අධිරාජ්‍යගැති ස්වභාවය හේතුකොටගෙන ය.

ලංකාවේ සිංහල ජාතිය ඇතිවූයේ එකොළොස්වැනි සියවසෙන් පසුව යැයි කී අනුකාරක ඉතිහාසඥයා ද මාක්ස්වාදයෙකි. ඔහුට ධනපති ක්‍රමය සිහි නොවීමෙන් පෙන්නුම්කරන්නේ ඔහුට අඩුම තරමින් මාක්ස්වාදී මතවාද සමගවත් සංගත වීමට අවශ්‍යතාවක් නො වීම ය. මේ උගතුන් යැයි කියාගන්නවුන්ට සංගතවීම ගැන එතරම් අවබෝධයක් හෝ තැකීමක් හෝ නැත. සංගතවීම අනිවාර්ය යැයි මෙයින් නො කියැවෙයි. එහෙත් අඩුම තරමින් හැකි අවස්ථාවල හෝ සංගතවීමට උත්සාහ කළ යුතු ය. මේ ඊනියා ඉතිහාසඥයා කුමක් කීව ද එකොළොස්වැනි සියවසට පෙර මෙරටට සිංහල ද්වීපය, සිංහලය, හෙළය, මෙරට වැසියන්ට සිංහලයන් යැයි පිටරැටියන් කී අවස්ථා මෙරට ඈත අතීතයේ සිට සිංහලයන් වාසය කළ බව නිගමනයකිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයටත් වඩා සාධක ඇත. ඔහු ඒ කිසිවක් සැලකිල්ලට නො ගනියි. එයට හේතුව  ඔහුගේ ඊනියා ප්‍රබුද්ධත්වය හා බොරු මාක්ස්වාදය ය. අප බොහෝ අවස්ථාවල පෙන්වා දී ඇති පරිදි මෙරට ප්‍රබුද්ධයකුවීම සඳහා කෙටිම මග සිංහල බෞද්ධ විරෝධී වීම ය. මේ කසිකබල් මාක්ස්වාදී ඉතිහාසඥයා හැමතැනම අහුලා දෙමළ යන වචනය සඳහන් තැන් කිහිපයක් සොයාගෙන ඒ හුවා දක්වා ප්‍රකාශ කෙළේ සිංහල යැයි සඳහන් තැනක් නොවන බව ය. මොහු නොදන්නා කරුණක් නම් සිංහල රටේ අමුතුවෙන් සිංහල යැයි කීමේ අවශ්‍යතාවක් නොමැති බව ය.

අද වුවත් තත්ත්වය එසේම ය. ඇතැමුන් ජාතිවාදී යැයි බෙරිහන් දුන්න ද පුවත්පත්වල දෙමළ තරුණයකු නැත්නම් මුස්ලිම් තරුණයකු අත් අඩංගුවට පත්වේ ආදී වශයෙන් සඳහන්වන්නේත් සිංහල තරුණයකු අත් අඩංගුවට ගත්විට විශේෂණ පදයක් නොමැතිව තරුණයකු අත් අඩංගුවට පත්වේ යනුවෙන් යෙදෙන්නේත් සිංහල යන්න මේ රටේ සාමාන්‍යය බවට අවුරුදු දහස් ගණනක් තිස්සේ පත්ව තිබීම ය. එහි ඇති ජාතිවාදයක් නැත.  පරිගණක ක්ෂෙත්‍රයෙහි නිතර යෙදෙන වචනයක් වනුයේ ඩිෆෝල්ට් යන්න ය. වෙනත් අයකු හෝ යමක් ඉදිරිපත් නොවී ඇතිවිට පවත්නා සාමාන්‍ය තත්ත්වය ඩිෆෝල්ට් යන්නෙහි ගැබ් වී ඇත. බොහෝ පරිගණකවල සාමාන්‍ය තත්ත්වය හෙවත් ඩිෆෝල්ට් තත්ත්වය අනුව යොදාගැනෙන භාෂාව ඉංගිරිසි ය. සිංහලෙන් ලිවීමට අවශ්‍ය නම් ඒ සඳහා අවශ්‍ය වෙනස්කම් කළ යුතු ය. මේ රටේ අවුරුදු දහස්ගණනක් තිස්සේ සාමාන්‍යය වී ඇත්තේ සිංහල ය. රාජ්‍ය භාෂාව ද ව්‍යවහාරික භාෂාව

© Prof. Nalin De Silva

ද සිංහල විය. එය නැතිවූයේ  පෘතුගීසීන්ගේ පැමිනීමත් සමග ය. ඊනියා උසස් සමාජයේ භාෂාව පෘතුගීසි විය. ලන්දේසි කාලයේ පමණක් නොව ඉංගිරිසි පාලන සමයේ දී ද කලක් යනතුරු වැදගත්යැයි සම්මත අයගේ භාෂාව පෘතුගීසි විය. පසුව එය ඉංගිරිසි විය. 1956 දී සිංහලයන් ඉල්ලා සිටියේ නැවත සිංහල සාමාන්‍යය බවට පත්කරන ලෙස ය. ඉංගිරිසිහු මේ තත්ත්වයට කල්තබා සූදානම් වී සිටියහ. ඔවුන් දෙමළ ජාතිවාදය නිර්මානය කර සිංහලත්වයට එරෙහිව දෙමළ ජාතිවාදීන් මෙහෙයවූහ.

අර ඊනියා ඉතිහාසඥයාගේ තර්කය අනුව යමින් තව අවුරුදු දෙසියයකින් පමණ ඔහු වැනිම වූ ඉතිහාසය හැදෑරූ ප්‍රබුද්ධයකුට මෙරට මේ කාලයේ පළ වී ඇති පුවත්පත් කියවා විසිවැනි විසිඑක් වැනි සියවස්වල මෙරට ජීවත්වී ඇත්තේ දෙමළ හා මුස්ලිම් ජනයා පමණක් ය යන නිගමනයට එළඹිය හැකි ය. එයට හේතුව වත්මන් පුවත්පත්වල සිංහලයන් ගැන සඳහන් නො වීම ය.  ඒ අනාගත ඉතිහාසඥයාට නිකමට හෝ බුද්ධියක් තිබුණහොත් ඔහු ඒ පුවත්පත් සිංහලෙන් පළ වී ඇත්තේ ඇයි ද යන ප්‍රශ්නය නගනු ඇත. එසේ නොවන්නේ නම් ඔහු සිතනු ඇත්තේ ජාතිවාදීන් කිහිප දෙනකු බහුතර දෙමළ ජනයාට බලහත්කාරයෙන් සිංහල පුවත්පත් කියවීමට සලස්වා ඇති බව ය.

අද ඇතැම් ප්‍රබුද්ධයන්ගේ වෑයම වී ඇත්තේ හැකිනම් ලංකාවේ කොහෙන් හෝ දෙමළ සෙල්ලිපියක්  සොයා එකල දෙමළ ජනයා විශාල වශයෙන් මෙරට ව්‍යාප්ත වී සිටි බව පෙන්වීම ය. එහෙත් මේ ප්‍රබුද්ධයන්ට අමතකවන කරුණ නම් එක් දෙමළ සෙල්ලිපියකට සිංහල සෙල්ලිපි දහසක් ඇති බව ය. එකලත් සමහරවිට සිංහල ජාතිවාදී රජවරු බහුතර දෙමළ ජනයාට බලහත්කාරයෙන් සිංහල සෙල්ලිපි කියවීමට සැලැස්සුවේ යැයි යමකු නිගමනය කළහොත් පුදුම නොවිය යුතු ය. මේ දෙමළ සෙල්ලිපි ප්‍රමාණයට වඩා අද ප්‍රංශ හා ජර්මන් ආදී භාෂාවලින් ලියැවුණු ප්‍රකාශන ගුවන්තොටුපොළේ හා සංචාරක හෝටල්වල  ඇති බව ද අමතක නොකළ යුතු ය. අනුපාතයක් ලෙස ගතහොත් එය අඩුවිය හැකිවුව ද, ඊනියා ඉතිහාසඥයන්  මෙවැනි සාධක මගින් ජනතාව මුළාකිරීමට උත්සාහකිරීම කණගාටුදායක ය.

ඉතිහාසඥයන් තමන්ගේ ව්‍යාපෘති අනුව ඉතිහාසය ලියන බව පැහැදිලි ය. අද බොහෝ දෙනා උත්සාහකරන තවත් කරුණක් වී ඇත්තේ තමිල්නාඩුවේ දෙමළ ජනයා තොග පිටින් බෞද්ධ වී සිටි බව පෙන්වා දීමට ය. එහෙත් මෙහි දී කෙරෙන වරදක් නම් ද්‍රවිඩ දේශය යැයි හඳුන්වනු ලබන ප්‍රදේශය දෙමළ ගොඩටම දැමීම ය. මගේ හිතවතකු විසින් කරන ලද අධ්‍යයනයන්හි දී හෙළි වී ඇති කරුණක් නම් ද්‍රවිඩ යැයි කියැවෙන ප්‍රදේශයේ ඉතිහාසය අමුතුවෙන් ම ලිවීමට සාධක ඇති බව ය. ඔහු පෙන්වාදෙන්නේ ඉන්දියාව ඉංගිරිසින් විසින් පාලනය කරනු ලැබීමේ දී මදුරාසියෙන් පාලනය වූ ප්‍රදේශ අද දෙමළ ප්‍රධාන ද්‍රවිඩ දේශයක මුල ලෙස සැලකිය හැකි බව ය. අද කාංචිපුරම් නමින් හැඳින්වෙන ප්‍රදේශය තමිල්නාඩු ප්‍රාන්තයට අයත්වුවත් එදා එය අයත්වී ඇත්තේ අන්ද්‍රා ප්‍රදේශයට ය. අන්ද්‍රා ප්‍රදේශයේ බෞද්ධ යටගියාව අද තමිල්නාඩුවට ද උරුම කෙරෙන්නේ පණහේ දශකයේ දී භාෂාව මත ඉන්දියාව ප්‍රාන්තවලට කැඩීමේ දී කාංචිපුරම් නමින් හැඳින්වෙන ප්‍රදේශය තමිල්නාඩු ප්‍රාන්තයට අයත්වන ලෙස බෙදීම නිසා ය.

ආන්ද්‍ර ප්‍රදේශය කලක් බෞද්ධ මධ්‍යස්ථානයක් ව තිබූ බව පැහැදිලි ය. එහෙත් තමිල්නාඩුව සම්බන්ධයෙන් එවැන්නක් කිව හැකි ද? අනෙක් අතට ආන්ද්‍ර ප්‍රදේශයේ ද්‍රවිඩ සම්භවය ගැන සඳහන්වන දේ නිවැරදි ද? චෝල අධිරාජ්‍යයට දකුණු ඉන්දියාවේ විශාල ප්‍රදේශයක් අයත්වීමෙන් පසුව ආන්ද්‍ර කර්නාටක ආදී ප්‍රදේශ ද්‍රවිඩ බවට පත්වී ද? ආන්ද්‍ර ප්‍රදේශයේ භාෂාව වූ තෙලිගු හා කර්නාටකයේ භාෂාව වූ කන්නඩ් අතර ඇති සම්බන්ධය ඒ භාෂා හා දෙමළ භාෂාව අතර ඇති සම්බන්ධයට වඩා වෙනස් ද? මේ ප්‍රශ්න ගැන අද අප අමුතුවෙන් සොයාබැලිය යුත්තේ ඉතිහාසය ඉගෙනීම ඉතිහාසඥයන්ට පමණක් පැවරීම නුසුදුසු බැවින් ය. ඉතිහාසය වෙනත් බොහෝ විෂයයන්ට වඩා රටක අනාගතය තීරණයකිරීමේ දී බලපායි. මෙරට පමණක් නොව මේ කලාපයේ ම ඉතිහාසය අමුතුවෙන් හැදෑරිය යුතුවෙයි. චෝල අධිරාජ්‍ය සමයේ දී මේ කලාපයේ ඉතිහාසය චෝලයන්ට අවශ්‍ය ආකාරයට වෙනස් කෙරී ඇති බව පෙනෙයි. එමෙන් ම එකල චෝලයන්ගේ ආධිපත්‍යය යටතේ දෙමළ නොවන දකුණු ඉන්දියාව ද ද්‍රවිඩ වී ඇති බව පෙනෙයි. විජයබාහු රජු නොවන්නට සිංහලයන් ද ද්‍රවිඩවීමට තිබූ අතර සිංහලයන්ගේ සම්භවය ද අමුතුවෙන් ලියැවීමට ඉඩ තිබුණි. එසේ නොවීම අද ඇතැමුන්ට ප්‍රශ්නයක් වී ඇති බව ඔවුන් ලියන ඉතිහාසයෙන් පෙනී යයි.

© Prof. Nalin De Silva